## (ඊ) මහ බැංකු කටයුතු

1963 දෙසැම්බර් මාසයේ දී රුපියල් කෝටි 11·42 ක්ව පැවති මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය, 1964 ජනවාරි මාසයේ දී රුපියල් කෝටි 6·9 දක්වා අඩු වුව ද 1964 පෙබරවාරි මාසයේ දී රුපියල් කෝටි 11·69 දක්වා වැඩිවිය. මේ වැඩිවීමෙන් පිළිබිඹු වූයේ තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුවෙන් රුපියල් කෝටි 5·33 ක ප්‍රකාශිත වටිනාකමක් ඇති විදේශීය වත්කම් පෙබරවාරි මාසයේ දී මහ බැංකුව විසින් මිලට ගැනීමෙකි. මේ වත්කම් වෙනුවට සමාන වටිනාකමක් ඇති දේශීය සුරැකුම්පත් මහ බැංකුව විසින් නිකුත් කරන ලදී. ජාත්‍යන්තර සංචිතය අප්‍රේල් මාසයේ දී රුපියල් කෝටි 10·0 දක්වා අඩුවුවද, අවුරුද්දේ අවසාන කාර්තුවේ දී නැවත අඛණ්ඩව වැඩි වූ බැව් පෙනේ. දෙසැම්බර් මස අවසානයේ දී ජාත්‍යන්තර සංචිතය රුපියල් කෝටි 13·59 ක්ව පැවතින. මේ අනුව 1963 දී රුපියල් කෝටි 3·79 කින් හෙවත් සියයට 24·9 කින් අඩු වූ මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය 1964 දී රුපියල් කෝටි 2·17 කින් හෙවත් සියයට 19·0 කින් වැඩි වූ බැව් පෙනේ. එසේ වුව ද, 1964 දී මුළු විදේශීය වත්කම් රුපියල් කෝටි 11·13 කින් හෙවත් සියයට 24·1 කින් අඩු විය. ඉකුත් අවුරුද්දේ මුළු විදේශීය වත්කම් අඩු වූයේ රුපියල් කෝටි 4·16 කින් හෙවත් සියයට 8·2 කිනි. මහ බැංකුවේ මුළු ව්‍යවහාර මුදල් හා තැන්පතු වගකීම්වල අනුපාතයක් වශයෙන් ජාත්‍යන්තර සංචිතය සියයට 9·3 (1963) සිට සියයට 10·4 (1964) දක්වා වැඩි විය.

මහ බැංකුවේ දේශීය වත්කම් ද රුපියල් කෝටි 15·50 කින් හෙවත් සියයට 12·0 කින්, රුපියල් කෝටි 144·92 දක්වා වැඩි වූ බැව් පෙනේ. 1963 දී මේ වත්කම් වැඩි වූයේ රුපියල් කෝටි 19·40 කින් හෙවත් සියයට 17·6 කිනි. දේශීය වත්කම් වැඩිවීමෙන් රුපියල් කෝටි 12·32 ක් රජයේ හා රජය ඇප වූ සුරැකුම්පත් වැඩිවීමේ ප්‍රතිඵලය විය. මහ බැංකුව වෙත වූ රජයේ හා රජය ඇප වූ සුරැකුම්පත් 1963 දී සියයට 15·8 කින් වැඩි වූ අතර 1964 දී වැඩි වූයේ සියයට 12·0 කිනි. මහ බැංකුව විසින් රජයට දෙනු ලැබූ අත්තිකාරම් රුපියල් කෝටි 0·68 කින්ද වෙළෙඳ බැංකුවලට දෙනු ලැබූ අත්තිකාරම් රුපියල් කෝටි 1·88 කින්ද වැඩිවිය.

1964 දී මහ බැංකුවේ තැන්පතු වගකීම් රුපියල් කෝටි 4·71 කින් වැඩි විය. මේ වෙනස බෙහෙවින්ම ඇතිවූයේ වෙළෙඳ බැංකු සතු තැන්පතු රුපියල් කෝටි 3·94 කින් වැඩි වූ නිසාය.

1963 දී රුපියල් කෝටි 11·15 කින් හෙවත් සියයට 14·1 කින් වැඩි වූ මහ බැංකුවේ ව්‍යවහාර මුදල් නිකුතුව 1964 දී වැඩි වූයේ රුපියල් කෝටි 3·12 කින් හෙවත් සියයට 3·5 කින් පමණි. බැංකු වෙත වූ ව්‍යවහාර මුදල් රුපියල් කෝටි 0·72 කින්ද මහජනයා වෙත වූ ව්‍යවහාර මුදල් රුපියල් කෝටි 2·46 කින්ද වැඩි වූ අතර, රජය වෙත වූ ව්‍යවහාර මුදල් රුපියල් කෝටි 0·06 කින් පිරිහිණ.

### ණය ප්‍රතිපත්තිය

1963 දී රුපියල් කෝටි 13·69 කින් වැඩි වූ පෞද්ගලික අංශයට දෙනු ලැබූ මුළු වෙළෙඳ බැංකු ණය පරිමාව සමාලෝචිත වසර තුලදී රුපියල් කෝටි 9·20 කින් වැඩිවිය. 1963 දී සහ 1964 දී ආනයන සීමාවන් වඩාත් දැඩි වූ අතර එතෙක් සීමා නොවූ ආනයන භාණ්ඩයන් සමහරක් පිළිබඳව ආනයන සීමාවන් පැන වූ බවද පෙනේ. මෙවැනි අවස්ථාවෙක බැංකු ණය අඛණ්ඩව වැඩිවීමෙන්, අර් ක්‍රමය තුල අධික උද්ධමනාත්මක බලපෑම් පැන නැගිය හැකි තත්වයක් උද්ගත වී

ඇත. එක් අතකින් බැංකු ණය වැඩිවීමත් සමගම, මූල්‍ය ඉල්ලුම ඉතාම අධික විය හැකි තත්වයක් මතුවිය හැකි බවද, සමපේක්ෂණාත්මක බලාපොරොත්තු අනුව භාණ්ඩයන් රාශිකරණය කිරීම නිසා මූල්‍ය ඉල්ලුම වඩාත් වැඩිවිය හැකි බැව්ද මහ බැංකුවට වැටහින. අනෙක් අතින්, නිෂ්පාදනය වැඩිවීමට තුඩු දෙන ප්‍රවණතාවයන් අඩපන නොවන අන්දමින් ක්‍රියා කිරීමට මහ බැංකුව විශේෂයෙන්ම උනන්දු වූවාය. රජයේ වියදම් වැඩිවෙන විට, ඒ සඳහා බැංකු ණය ගැනීමෙන් වැලකී සිටීමට [1]රජය ගන්නා උත්සාහයන් ගැනද මහ බැංකුව සිහි තබා ගතයුතු විය.

මහ බැංකුවේ ණය ප්‍රතිපත්තිය ඉහත සඳහන් සාධකයන් අනුව හැඩ ගැසුණක් විය යුතුවිය. බැංකු ණය අඛණ්ඩව වැඩි වුවද, පාරිභෝජනය හා අනවශ්‍ය අරමුණු සඳහා මේ ණය යෙදෙතැයි ඉදුරා කිවහැකි සාධකයන් නොවීය. 1964 දී ලෝන සහ අයිරාවන් රුපියල් කෝටි 10·68 කින් වැඩි වුවද ඉන් රුපියල් කෝටි 2·26 ක් රජයේ සමායතනයන්ටද, රුපියල් කෝටි 2·57 ක් සමුපකාර ආයතනයන්ටද, රුපියල් කෝටි 5·85 ක් පෞද්ගලික ව්‍යාපාරයන්ට හා පුද්ගල-යන්ටද දෙනු ලැබූ ණය වැඩිවීම් විය. උද්ධමනාත්මක බලපෑම් ඇතිවෙන අවස්ථාවන්හි භාණ්ඩ තොග වශයෙන් තබා ගැනීම පිණිස බැංකු ණය පිළිබඳව ඇතිවන ඉල්ලුම් වැඩි වෙතැයි සිතිය හැක. එහෙත් 1964 දී ඇති වූ මුළු බැංකු ණය ප්‍රසාරණයෙන් කොතරම් ප්‍රමාණයක් භාණ්ඩ තොග ගසා ගැනීම සඳහා යොදන ලදදැයි කීම දුෂ්කරය. බැංකු අත්තිකාරම් අරමුණු අනුව විග්‍රහ කිරීමේදී, 'අනෙකුත් අරමුණු' සඳහා දුන් ණය වැඩිවීමෙන්ද ඇප වර්ගයන් අනුව විග්‍රහ කිරීමේදී වෙළෙඳ තොග ඇප කොට දුන් ණය හා ඇප රහිත ණය වැඩිවීමෙන්ද, සමපේක්ෂණ කටයුතු සඳහා යෙදවුනු බැංකු ණය වැඩිවිණැයි සිතිය හැක. කලින් පනවන ලද ණය පාලන විධිවිධානයන් ක්‍රියාත්මක වෙමින් පැවතින. මේ හැර වෙළෙඳ බැංකු ණය අනවශ්‍ය අරමුණු සඳහා නොව නිෂ්පාදන අරමුණු සඳහා යෙදවීමේ ලා සදාචාර බලපෑමද බලවත් ආයුධයක් වෙයි.

**බැංකු ක්‍රම දියුණුව**

1964 ජූලි මාසයේදී මහ බැංකුවේ සාමාන්‍ය සංචිතයෙන් ලබාගත් රුපියල් කෝටියක මුදලකින්, මැදි හා දිගු කාලීන ණය අරමුදල ආරම්භ කරන ලදී. ණය දෙන ආයතනයන්ට[2] අවශ්‍ය වූ විටෙක මහ බැංකුවෙන් ණය පහසුකම් ලබාගැනීමට සැලැස්වීමෙන් නිෂ්පාදන අරමුණු[3] සඳහා ණය දීම වැඩිකිරීම මෙහි බලාපොරොත්තුව වීය. එසේ වුවද, 1964 අවසාන වනතෙක්ම, අරමුදලෙන් ණය පහසුකම් ලබා ගැනීමට කිසිවකු ඉදිරිපත් නොවීය. මෙය හේතූන් රාශියක් නිසා වී යයි සිතිය හැක. පළමුවෙන්ම, අමු ද්‍රව්‍ය හා ධන භාණ්ඩ ආනයන කිරීම් පිළිබඳව පනවා ඇති ආනයන සීමාවන් නිසා දිගුකාලීන ණය සඳහා ඇතිවන ඉල්ලුම් ද අඩුවුනා විය හැකිය. දෙවැනිව දිගුකාලීන ණය සඳහා ඉල්ලුමක් ඇති වුවද, තම ද්‍රවශීලතාව වැඩිවීම නිසා, අරමුදලෙන් ණය පහසුකම් නොලැබ, එම ඉල්ලුම සපුරාලන්නට වෙළෙඳ බැංකුවලට හැකිවිය. තවද, අරමුදලෙහි නවතාවයද එය ක්‍රියාකාරීව පැවතියේ කෙටි කාලයක් තුල වීමද මේ පිළිබඳව වැදගත් වූ තවත් සාධකයක් විය.

---

1· රජයට මහ බැංකුවෙන් ලැබුණු ණය (එනම්, ලෝන, අත්තිකාරම් සහ ආයෝජන) 1962 දී රුපියල් කෝටි 17·89 කින්ද 1963 දී රුපියල් කෝටි 14·65 කින්ද, 1964 දී රුපියල් කෝටි 13·04 කින්ද වැඩිවිණ· රජයට වෙළෙඳ බැංකු වලින් දෙනු ලැබූ ණය 1962 දී රුපියල් කෝටි 7.14 කින්ද 1963 දී රුපියල් කෝටි 2·03 කින්ද වැඩිවූ අතර, 1964 දී රුපියල් කෝටි 2·54 කින් අඩුවිය·

2· මුදල් නීති පනතේ 127 ඡේදයේ (1) වැනි අනු ඡේදයේ අර්ථ නිරූපනය කර ඇති පරිදි, ලංකා සංවර්ධන මුදල් සමායතනය ඇතුළු සෑම බැංකු ආයතනයක්ම මෙහිදී ණය දෙන ආයතනයක් වශයෙන් හැඳින්වේ,

3· වරින් වර මුදල් මණ්ඩලය විසින් නියම කෙරෙන පරිදි, කර්මාන්ත, කෘෂිකර්මය, වෙළෙඳාම, වාණිජ කටයුතු හා ව්‍යාපාරයන්ද නිෂ්පාදන අරමුණු වලට අයත්වේ.

ණය රක්‍ෂණ ක්‍රමයක් ආරම්භ කිරීමේ හැකියාව ගැනද වසර තුළදී මහ බැංකුව විමසිලිමත් වූවාය. මේ පිළිබඳ සීමිත සැළැස්මක් දැනට පිළියෙල කරගෙන යනු ලැබේ.

1964 දී මහ බැංකුව නව ගොඩනැගිල්ලට ගෙනයාමෙන් පසු, මහ බැංකුව විසින් ආරම්භ කරන ලද බැංකු කරුවන් පුහුණු කිරීමේ ආයතනයද වඩාත් දියුණු විය. කලින් වෙළෙඳ බැංකුවල සහයෝගය ඇතිව මහ බැංකුව විසින් පවත්වන ලද බැංකු කරුවන් පුහුණු කිරීමේ සීමිත සැලැස්මෙන් මේ ආයතනය බිහිවිය. 1964 දෙසැම්බර් මස අවසානයේ දී, ආයතනයේ ලියාපදිංචි වූ ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාව 900 ක් පමණ විය. 1964 දී මේ ආයතනය විසින් මහජන බැංකුවට අළුතින් බඳවා ගත් අය සඳහා විශේෂ කෙටි කාලීන පංති මාලාවක් ද පවත්වන ලදී.